අපනයන වර්ධනය සඳහා වර්ෂය තුළදී විවිධ ක්‍රියාමාර්ගයන් හඳුන්වාදී ඇත. කෘෂිකාර්මික භෝග නැවත වගාකිරීම සහ අලුතින් වගාකිරීම සඳහා වූ සහනාධාර වැඩි වන සේ වෙනස් කරන ලදී. 1978 දී විදේශ චාරිකා සඳහා විදේශ විනිමය ප්‍රධානයන් වැඩිකිරීමට යෙදුනි. අපනයනයන්ට නැඹුරුවූ විදේශීය ආයෝජන ඇදගැනීම සඳහා 'අපනයන සංවර්ධන ප්‍රදේශ' පිහිටුවීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටුවන ලදී. 1978 වර්ෂය තුළදී එහි කර්මාන්ත පිහිටුවීම සඳහා අනුමතීන් 52 ක් ප්‍රදානය කිරීමට යෙදුනි.

අපනයන වර්ධනය සඳහා තවත් වැදගත් ක්‍රියාමාර්ගයක් වූයේ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයට පත්ව තිබූ (1979 දී හඳුන්වා දුන්) අපනයන ණය සහතික කිරීමේ සංස්ථාව පිහිටුවීමයි. මෙම සංස්ථාව අපනයන කරුවන්ට ලිහිල් පදනමක් මත බැංකු ණය ලබාගැනීමට ආධාර වන අතර විදේශීය ගැනුම්කරුවන් විසින් කල් පසුවී කරන ගෙවීම් හෝ නොගෙවීම් වල අවදානමෙන් ආරක්‍ෂාව සඳහා මාර්ගයක්ද සපයයි. අපනයන සංවර්ධනය පිළිබඳ ඇමතිවරුන්ගේ සභාවක් සහ අපනයන සංවර්ධන මණ්ඩලයක් පිහිටුවීම සඳහාද නීතිපැනවීමේ කටයුතු සකස්කරමින් පැවතුනි. අපනයන වර්ධනය සඳහා අවශ්‍ය බලතල මේ මණ්ඩලය වෙත පැවරෙනු ඇත.

## ගෙවුම් තුලනය[1]

1978 දී ගෙවුම් තුලනය ප්‍රධාන වශයෙන් හැඩ ගැසුනේ 1977 දී ඇති කරන ලද ආර්ථික ප්‍රතිපත්ති සංශෝධනවල බලපෑමෙනි. මෙම ප්‍රතිපත්තිවලින් ගෙවුම් තුලනය කෙරෙහි වූ ක්‍ෂණික බලපෑම වූයේ 1977 දී ජංගම ගිණුමේ වූ රුපියල් දශ ලක්‍ෂ 1,266 ක (වි.හැ.අ. දශලක්‍ෂ 116 ක) අතිරික්තය 1978 දී රුපියල් දශලක්‍ෂ 782 ක (වි.හැ අ. දශලක්‍ෂ 64 ක) හිඟයක් බවට පත්වීමය. එසේ වූවද, විදේශ වත්කම් 1978 දී තව දුරටත් ඉහළ ගිය අතර, වසර අවසානයේ දී වූ විදේශ වත්කම් මට්ටම 1979 වර්ෂය සඳහා අපේක්ෂිත ආනයන වලින් මාස 4 ක ආනයන වියදම් ගෙවීමට ප්‍රමාණවත් විය. වර්ෂය තුළදී විශාල ලෙස ලැබුණ දිගු කාලීන ප්‍රාග්ධනය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලැබුණු ආධාර හේතු කොට ගෙන ප්‍රාග්ධන ගිණුමේ ඇති වූ අතිරික්තය විදේශ වත්කම් මෙලෙස වර්ධනය වීමට හේතු විය.

විනිමය හා වෙළඳ සීමාවන් ලිහිල් කිරීමේ බලපෑම ගෙවුම් තුලනය කෙරෙහි කැපී පෙනෙන ලෙස දක්නට ලැබුනේ විශේෂයෙන් ආනයන සම්බන්ධයෙනි. ආනයන වියදම 1977 දී රුපියල් දශලක්‍ෂ 6,290 (වි.හැ.අ. දශලක්‍ෂ 622) සිට 1978 දී රුපියල් දශලක්‍ෂ 15 350 (වි.හැ.අ. දශලක්‍ෂ 808) දක්වා වැඩි වූ අතර වි.හැ.අ.[2] අනුව බලන කල මෙම වැඩිවීම සියයට 30 ක් විය. කාලයක් තිස්සේ පාලන සීමා යටතේ අවහිරව පැවති ඉල්ලුම නිදහස් කිරීම මෙම ආනයන වැඩිවීමෙන් පිළිබිඹු විය. ආනයන වර්ධනය කෙරෙහි ආයෝජන සහ අතරමැදි භාණ්ඩ ප්‍රධාන වශයෙන් හේතු වූ අතර පරිභෝජන භාණ්ඩ ආනයන ඊට වඩා අඩුවේගයකින් වැඩි විය. 1978 දී ප්‍රාග්ධන භාණ්ඩ ආනයන දෙගුණයකටත් වඩා වැඩිවීම, එක් අතකින් අවුරුදු ගණනක් තිස්සේ දේශීය කර්මාන්තයන්හි පැවති අවහිරතාවයන් පිළිබිඹු


---

1. ගෙවුම් තුලනයෙහි යොදාගෙන ඇති වෙළඳ දත්තයන්ගෙන් දක්වෙන්නේ වර්ෂය තුළ සිදුවූ ලැබීම හා ගෙවීමය. මෙම දත්තයන් අපනයන හා ආනයනයන්ගේ ද්‍රව්‍යමය චලනය නිරූපනය කරන මීට ඉහත දක් වූ විදේශීය වෙළඳ දත්තයන්ගෙන් වෙනස්වේ. එම වෙනසට හේතුව නම් එක් අතෙකින් ලැබීම හා ගෙවීම් ද අනික් අතින් භාණ්ඩයන්ගේ ද්‍රව්‍යමය චලනය ද අතර පවත්නා වෙනසයි.

2. ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතිකයේ නිතර ඇතිවූ වෙනස්කම් හා 1977 න් පසුව ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ග අතර පැවති විනිමය අනුපාතිකවල අස්ථායිතාවයන් නිසා ගෙවුම් තුලනය සම්බන්ධ කාල ශ්‍රේණි දත්තයන් සංසන්දනය කිරීම අසීරු කරුණක් විය. ස්ථායී මූල්‍ය ඒකකයක් නොමැතිවීම නිසා සංසන්දනාත්මක කාර්යයන් සඳහා ගිණුම් ඒකකයක් ලෙස විශේෂ හැරගැනීමේ අයිතීන් (වි හැ.අ) මෙහිදී යොදා ඇත.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව





ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශ වත්කම්

● ත්‍රෛමාසිකව




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

කළ අතර අනෙක් අතින් මෙය පුළුල් වූ කාර්මික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. කලින් පැවති විදේශ විනිමය සම්පත් සීමාවන් හා දැඩි ආනයන පාලනයන් නිසා විදේශ සම්පත් උපයෝජනය යම් යම් අත්‍යවශ්‍ය ආනයනයන් සඳහා සීමා වූ අතර එමගින් ආර්ථික වර්ධනය පවත්වා ගැනීමට අවශ්‍ය ආයෝජන භාණ්ඩ ආනයනය වැලකිණි. භාණ්ඩ විශාල ප්‍රමාණයක් සඳහා පැවති ආනයන බලපත්‍ර ක්‍රමය අහෝසි කිරීමත් සමගම ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයන්හි විශාල වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යන්ත්‍රෝපකරණ හා අමු ද්‍රව්‍ය සුලභවීම නිසා 1974-77 යන සිව් වසරක කාලය තුළ සියයට 57 ක පමණ පහත් මට්ටමක පැවති කාර්මික ධාරිතා උපයෝජනය (1978 දී සියයට 70) වඩා හොඳ මට්ටමක පැවතීමට හේතු විය.

1978 දී ආනයන ගෙවීම් සැළකිය යුතු ලෙස වැඩිවුවද එය වර්ෂය සඳහා මුලදී අපේක්ෂිත ප්‍රමාණයට වඩා තරමක් අඩු මට්ටමක පැවතින. මෙය හේතු කිහිපයක ප්‍රතිඵලයක් ලෙස සැළකිය හැකිය. පළමුව, ආනයන සඳහා පැවති ප්‍රමාණාත්මක සීමාවන් ඉවත් කළද ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයන මිළ වැඩිවීම ආනයන ඉල්ලුම තරමක් දුරට අඩුවීමට හේතු විය. දෙවනුව, උද්ධමන විරෝධි ක්‍රියා මාර්ගයක් වශයෙන් බැංකු ණය සීමා කිරීම, ආනයනකරුවන්ට ද්‍රවශීලතා දුෂ්කරතාවයන් ඇතිකිරීමට හේතු විය. තෙවනුව, වෙළඳපල තත්ත්වය අවබෝධ කර ගැනීමට ආනයනකරුවන්ට අපහසු වූ නිසා ඔවුන් බලාපොරොත්තු වූ තරම් ඉක්මණින් සමහර භාණ්ඩ, විශේෂයෙන් කල්පවතින භාණ්ඩ, දේශීය වෙළඳ පොලේ අලෙවි නොවීය. සිව්වෙනුව, සීමාවලින් යුක්තව පැවති දීර්ඝ කාලයකට පසු ආනයනකරුවනට විදේශීය ගනුදෙනුකරුවන් සමඟ සබඳතා නැවත ඇතිකර ගැනීමට සහ නව ක්‍රමයට හැඩ ගැසීමටද සෑහෙන කාලයක් ගතවේ.

ආනයනයන් විශාල ලෙස ඉහළ ගිය නමුදු 1978 දී අපනයන ආදයම් වැඩිවූයේ සියයට 4 කින් පමණි. එනම් 1977 දී රුපියල් දශලක්ෂ 6640 (වි.හැ.අ. දශලක්ෂ 651) සිට 1978 දී රුපියල් දශලක්ෂ 13,207 (වි හැ.අ. දශලක්ෂ 675) දක්වා අපනයන ආදයම් වැඩි විය. ඛණිජ තෙල් නොනිපදවන සංවර්ධනය වන රටවල මුළු අපනයන ආදයම් සමස්ථයක් වශයෙන් ගත් විට, 1978 වර්ෂය තුළ දී සියයට 9 ක තරම් ඉහළ වේගයකින් වැඩි වූ අතර ශ්‍රී ලංකාවේ අපනයන ඉපයීම් වැඩිවූයේ සියයට 4 කින් පමණි. මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන නිමැවුම් වර්ධනය නොවී එකම මට්ටමක පැවතීම නිසා එවැනි භාණ්ඩ අපනයනයෙන් ලැබුණු ආදයම් මට්ටම මුළුමණින්ම වාගේ ජාත්‍යන්තර වෙළඳ පලේ මිල උච්චාවචනයන්ට අනුරූප වන පරිදි වෙනස් විය.

අපනයන වර්ධන වේගය අඩුවීමේත් ආනයන වර්ධන වේගය විශාල ලෙස වැඩිවීමේත් ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ ශේෂය 1977 දී රුපියල් දශලක්ෂ 350 ක (වි.හැ.අ. දශලක්ෂ 28) අතිරික්තයක සිට 1978 දී රුපියල් දශලක්ෂ 2,143 (වි.හැ.අ. දශලක්ෂ 133) ක හිඟයක් බවට පත් විය. මුළු විදේශ විනිමය ඉපයුම්වල ප්‍රතිශතයක් ලෙස ආනයන වියදම 1977 දී සියයට 82 සිට 1978 දී සියයට 98 දක්වා වැඩි විය.

### 1·12 වැනි සංඛ්‍යා සටහන

### ගෙවුම් තුලනය - 1969 - 1978

රු. දශලක්ෂ (වරහන් තුල වි. හැ. අ. දශලක්ෂ)

| වර්ෂය | වෙළඳ ශේෂය | ශුද්ධ සේවා | ශුද්ධ සංක්‍රාම | ජංගම ගිණුමේ ශේෂය | ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධනය | මූලික ශේෂය |
|---|---|---|---|---|---|---|
| 1969 | − 746 (−157) | − 90 (−19) | + 39 (+8) | − 797 (−167) | + 275 (+58) | − 522 (−110) |
| 1970 | − 315 (−52) | −104 (−17) | + 69 (+12) | − 350 (−59) | + 184 (+31) | − 166 (−28) |
| 1971 | − 287 (−47) | − 14 (−2) | + 85 (+14) | − 216 (−35) | + 404 (+66) | + 188 (+31) |
| 1972 | − 255 (−38) | − 15 (−2) | + 74 (+11) | − 196 (−29) | + 292 (+44) | + 96 (+14) |
| 1973 | − 299 (−39) | + 53 (+7) | + 85 (+11) | − 161 (−21) | + 190 (+25) | + 29 (+4) |
| 1974 | −1263 (−158) | + 76 (+10) | + 280 (+35) | − 907 (−113) | + 298 (+37) | − 609 (−76) |
| 1975 | −1421 (−168) | + 89 (+11) | + 560 (+66) | − 772 (−91) | + 559 (+66) | − 213 (−25) |
| 1976 | − 709 (−73) | +112 (+12) | + 547 (+56) | − 50 (−5) | + 610 (+63) | + 560 (+58) |
| 1977 | + 350 (+28) | +304 (+29) | + 612 (+59) | +1266 (+116) | + 563 (+54) | +1829 (+170) |
| 1978* | −2143 (−133) | +119 (+6) | +1242 (+63) | − 782 (−64) | +2640 (+135) | +1858 (+71) |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා ගිණුම 1978 දී අඩු අතිරික්තයක් පෙන්නුම් කළ අතර එය 1977 දී රුපියල් දශලක්ෂ 304 (වි.හැ.අ දශලක්ෂ 29) සිට 1978 දී රුපියල් දශලක්ෂ 119 (වි.හැ අ දශලක්ෂ 6) දක්වා අඩු විය. 1977 නොවැම්බර් මාසයේ දී විදේශීය සංචාරය සම්බන්ධ නීතිරීති ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපාරික කටයුතු, අපනයන සංවර්ධන සහ වෙනත් කාර්යයන් උදෙසා ලාංකිකයන් විසින් විදේශ සංචාර සඳහා දැරූ වියදම 1977 දී රුපියල් දශලක්ෂ 33 (වි.හැ.අ දශලක්ෂ 3) සිට 1978 දී රුපියල් දශලක්ෂ 404 (වි.හැ.අ. දශලක්ෂ 23) දක්වා තියුණු ලෙස වැඩි විය. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු දල ඉපැයීම් 1977 දී රුපියල් දශලක්ෂ 304 (වි.හැ අ. දශලක්ෂ 29) සිට 1978 දී රුපියල් දශලක්ෂ 750 (වි.හැ අ. දශලක්ෂ 38) දක්වා වැඩිවී ඇතැයි ගණන් බලා තිබේ. වරාය, ප්‍රවාහණ සහ රක්ෂණ කටයුතුවලින් ලද අතිරික්තය වර්ෂය තුළදී අඩු විය. බොහෝසෙයින් මෙම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් 1973 සිට පැවති සේවා ගිණුමේ අතිරික්තය වැඩිවීමේ උපනතිය 1978 දී ප්‍රතිවිරුද්ධ දිශාවට යොමු විය. විදේශයන්හි, විශේෂයෙන් මැද පෙරදිග රටවල රැකියාවල නියුතු ලාංකිකයන් විසින් එවන ලද විදේශ විනිමය 1977 දී රුපියල් දශලක්ෂ 190 (වි.හැ අ. දශලක්ෂ 18) සිට 1978 දී රුපියල් දශලක්ෂ 610 (වි හැ අ. දශලක්ෂ 31) දක්වා දෙගුණයකට කිට්ටු ප්‍රමාණයකින් වැඩිවී ඇතැයි ගණන් බලා තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළු සංක්‍රාමවල අතිරික්තය රුපියල් දශලක්ෂ 612 (වි හැ අ දශලක්ෂ 59) සිට 1978 දී රුපියල් දශලක්ෂ 1242 (වි.හැ.අ. දශලක්ෂ 63) දක්වා වැඩි විය.

නොකඩවා තුන්වැනි වර්ෂයටත් 1978 දී ගෙවුම් තුලනයේ මූලික ශේෂය අතිරික්තයක් පෙන්විය. (1·12 වැනි සංඛ්‍යා සටහන) ජංගම ගිණුමේ රුපියල් දශලක්ෂ 782 (වි.හැ.අ. දශලක්ෂ 64) ක හිඟයට එරෙහිව මූලික ශේෂයේ ඇතිවූ රුපියල් දශලක්ෂ 1858 (වි.හැ අ. දශලක්ෂ 71) ක අතිරික්තය, වර්ෂය තුළදී ලැබුණ අධික දිගුකාලීන ප්‍රාග්ධනය පෙන්නුම් කරයි. දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් රුපියල් දශලක්ෂ 2,640 (වි.හැ.අ. දශලක්ෂ 135) දක්වා දෙගුණයකින් පමණ වැඩිවූ අතර එය මෙතෙක් වාර්තා වූ ඉහළම වැඩිවීමයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සහ වෙනත් ජාත්‍යන්තර ආයතන සහ විදේශීය රාජ්‍යවලින් ලද ආධාරවල වැඩිවීම මෙම ප්‍රාග්ධන ලැබීම්වල වැඩිවීමට හේතු විය. සංවර්ධන යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දේශීය මූල්‍ය සම්පත් ප්‍රමාණවත් මට්ටමක නොවීම නිසා විදේශීය ප්‍රාග්ධනය රටතුලට ගලාඒම වැදගත් ලක්ෂණයක් ලෙස පෙනී යයි මේ සමඟම, 1978 වර්ෂය තුළදී ගිවිසගත් ණයවලින් වැඩි කොටසක්ම සාපේක්ෂ වශයෙන් වඩා පහසු කොන්දේසි මත පදනම් වූ ඒවා විය.

වෙළඳ හා ගෙවීම් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයන ගෙවීම් වැඩිවීමත් සමඟම 1978 දී විදේශ සම්පත් පරතරය දෙගුණයකටත් වඩා එනම් රුපියල් දශලක්ෂ 3,798 (වි.හැ.අ. දශලක්ෂ 219) දක්වා වැඩි විය. (1.13 සංඛ්‍යා සටහන) මෙය 1976 දී රුපියල් දශලක්ෂ 2,456 (වි.හැ.අ. දශලක්ෂ 252) සිට 1977 දී රුපියල් දශලක්ෂ 4 860 (වි.හැ අ. දශලක්ෂ 87) දක්වා සම්පත් පරතරය අඩුවීමට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරයි. තේ සඳහා වඩා සතුටුදයක මිළ ගණන් පැවතීම 1977 දී අපනයන ආදයම් තියුණු ලෙස වැඩිවීමට හේතු විය. ආනයන වියදම වැඩිවීමත් අපනයන වර්ධනය අඩුවීමත් නිසා 1978 දී විදේශ සම්පත් පරතරය පුළුල් විය. සේවා අතිරික්තයේ අඩුවීම ද වර්ෂය තුළදී සම්පත් පරතරය වැඩිවීමට තරමක් දුරට හේතු විය.

1977 දී මෙන්ම 1978 දී ද විදේශ සම්පත් පරතරය මුළුමනින්ම වාගේ පියවන ලද්දේ දිගු කාලීන ණය වලිනි. දිගු කාලීන දළ ණය ලැබීම් 1977 දී රුපියල් දශලක්ෂ 1184 (වි.හැ අ.දශලක්ෂ 114) සිට 1978 දී රුපියල් දශලක්ෂ 3680 (වි.හැ.අ දශලක්ෂ 188) දක්වා සියයට 65 කින් වැඩි විය. මෙම ණය වලින් 1/3 කට කිට්ටු ප්‍රමාණයක් විවිධ සංවර්ධන යෝජනා ක්‍රමවලට සම්බන්ධිත යෝජනා ක්‍රම ආධාර වශයෙන් (රුපියල් දශලක්ෂ 1,222 හෝ වි·හැ·අ· දශලක්ෂ 62) ලැබිණ. මෙයට අමතරව, රුපියල් දශලක්ෂ 1,680 ක් (වි.හැ අ දශලක්ෂ 86) භාණ්ඩ හා ආහාර ණය වශයෙන් ලැබුණි. භාරකාර අරමුදල් වැඩපිළිවෙල යටතේ රුපියල් දශලක්ෂ 778 ක් (වි.හැ.අ. දශලක්ෂ 40) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සපයන ලදී. ඉකුත් වසරයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ගිවිසගත් සම්පස්ථ ණය වැඩපිළිවෙලේ අවසාන වාරික දෙකෙන් රුපියල් දශලක්ෂ 756 (වි.හැ.අ. දශලක්ෂ 38) ක් ලැබුණි. 1978 දී ලද ත්‍යාග ප්‍රදනයන් රුපියල් දශලක්ෂ 900 (වි හැ.අ. දශලක්ෂ 46) ක් වූ අතර විදේශ විනිමය අනුව බලන කල මෙය 1977 මට්ටමට බොහෝසෙයින් සමාන විය 1978 දී දිගුකාලීන මූල්‍ය ලැබීම් විශාල ලෙස වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සහනදයි නොවන කෙටිකාලීන වෙළඳ ණය වෙත නැඹුරුවීමට ඇති අවශ්‍යතාව 1977 දී මෙන්ම 1978 දීද අඩු විය.

දිගුකාලීන ණය සහ ත්‍යාග ප්‍රදනයන් විදේශ සම්පත් පරතරය පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා ලැබුණු අතර අතිරික්ත විදේශ විනිමය විදේශ වත්කම්වලට එකතු විය. වි.හැ.අ. අනුව බලන කල, දළ විදේශ වත්කම් 1978 අග වන විට වි.හැ අ. දශලක්ෂ 371 (රුපියල් දශලක්ෂ 7,477) දක්වා සියයට 21 කින් වැඩි විය. එම වත්කම් ප්‍රමාණය 1979 වර්ෂය සඳහා අපේක්ෂිත මාස 4 ක ආනයන ගෙවීම සඳහා ප්‍රමාණවත් විය. මහ බැංකුව විසින් විදේශයන්හි තබා ගන්නා ලද ද්‍රවශීල ශේෂයන්හි වැඩිවීම විදේශ වත්කම් ඉහළ යාමට හේතු විය.

ණය සේවා අනුපාතය, එනම් ප්‍රාග්ධන ගෙවීම් හා පොලී ගෙවීම් (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ආපසු ගෙවීම් හා බැංකු ණය ගැනීම් ඇතුලුව), වෙළඳ භාණ්ඩ අපනයන හා සේවාවලින් ලත් ඉපැයුම්වල ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 1977 දී සියයට 16 සිට 1978 දී සියයට 15 දක්වා යහපත් අතට හැරුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දිගු කාලීන ණය හා සැපයුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීම් අඩුවීම සහ අපනයනයන් හා සේවාවන්ගෙන් ලත් ආදායමේ වර්ධනයයි.

OF MORATUWA

## 1·13 වැනි සංඛ්‍යා සටහන

### විදේශ සම්පත් පරතරය පියවීම 1976 – 78

| ශීර්ෂ | රුපියල් දශලක්ෂ | | | එ. ජ. ඇ. දශලක්ෂ1 | | |
|---|---|---|---|---|---|---|
| | 1976 | 1977 | 1978 | 1976 | 1977 | 1978 |
| 1· විදේශීය ඉපැයීම් .. | 5,459 | 7,753 | 15,759 | 561 | 758 | 805 |
| 1·1· අපනයන .. | 4,707 | 6,640 | 13,207 | 484 | 651 | 675 |
| 1·2· සේවා .. | 643 | 923 | 1,942 | 66 | 89 | 99 |
| 1·3· පෞද්ගලික සංක්‍රාම .. | 109 | 190 | 610 | 11 | 18 | 31 |
| 2· විදේශීය ගෙවීම් .. | 7,915 | 8,613 | 19,557 | 813 | 845 | 1,024 |
| 2·1· ආනයන .. | 5,417 | 6,290 | 15,350 | 557 | 622 | 808 |
| 2·2· සේවා .. | 584 | 687 | 2,091 | 60 | 66 | 107 |
| 2·3· ප්‍රාග්ධන ආපසු ගෙවීම් | 1,914 | 1,636 | 2,116 | 196 | 157 | 109 |
| 3· විදේශ සම්පත් පරතරය .. | – 2,456 | – 860 | – 3,798 | – 252 | – 87 | – 219 |
| 4· සම්පත් පරතරය පියවීම .. | + 2,456 | + 860 | + 3,798 | + 252 | + 87 | + 219 |
| 4·1· දිගුකාලීන ණය2 .. | 943 | 1,184 | 3,680 | 96 | 114 | 188 |
| 4·2· ත්‍යාග ප්‍රදානයන් .. | 492 | 490 | 900 | 51 | 47 | 46 |
| 4·3· වෙළඳ ණය3 .. | 1,266 | 360 | 114 | 130 | 35 | 5 |
| 4·4· බැංකු ණය ගැනීම් . | 1 | 222 | — | — | — | — |
| 4·5· ද්විපාර්ශ්විකශේෂයන් | — | — | 1 | — | — | — |
| 4·6· ජා. මූ. අ. ණය ගැනීම්4 | 273 | 935 | 756 | 28 | 55 | 38 |
| 4·7· වෙනත්5 .. | 59 | 119 | 208 | 7 | 11 | 10 |
| 4·8· දේශ වත්කම් .. | – 568 | – 4,171 | – 1,904 | – 59 | – 169 | – 65 |
| 5· අගැයුම් පිළිබඳ ගැලපීම්6 .. | — | 1,680 | 344 | — | — | — |
| 6· වැරදීම් හා අත්හැරීම් .. | – 10 | + 41 | – 301 | – 1 | – 6 | – 3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1· 1976, 1977 සහ 1978 වර්ෂ සඳහා කාලීනව බර තබන ලද සාමාන්‍ය අනුපාතිකයන් පිළිවෙලින් රුපියල් 9·73 රුපියල් 10·42 සහ රුපියල් 19·58 පරිවර්තනය කිරීම සඳහා යොදාගන්නා ලදී.

2· යෝජනා ක්‍රම, භාණ්ඩ ආහාර හා වෙනත් ආධාර.

3· සැපයුම් කරුවන්ගේ ණය හා කෙටිකාලීන වෙළෙඳ ණය.


4· තෙල් පහසුකම් යටතේ ණය ගැනීම් ඇතුළත්ය.

5· පෞද්ගලික ප්‍රාග්ධනය ඇතුලත්ය.

6· විනිමය අනුපාතිකයේ වෙනස්කම් නිසා ගණන් බලන ලද වැඩිවූ විදේශ වත්කම්වල අගය.

# විනිමය අනුපාතික

සමුච්චිත ප්‍රතිශත වෙනස්වීම




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මැදිකාලීන ගෙවුම් ශේෂ ආධාර ලබාදීමට පිහිටුවා ඇති "පුළුල් කරන ලද අරමුදල් පහසුකම" යටතේ ආධාර ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාර්ථක සාකච්ඡාවක් 1978 දී පැවැත්විය. 1979 මුලදී එම ආධාර වැඩපිළිවෙල අනුමත කිරීමෙන් පසු. 1979 – 81 දක්වා කාලපරිච්ඡේදය සඳහා වි.හැ.අ. දශලක්ෂ 260·3 ක් (රුපියල් දශලක්ෂ 5,206) දක්වා ශ්‍රී ලංකාවට ණය ගැනීමට හැකිවේයයි බලාපොරොත්තු වේ. සාමාන්‍යයෙන් මෙම ණය ගැනීම් ණය ගත් දින සිට අවුරුදු 4 — 8 දක්වා කාලයක් තුළ සමාන වාරික 16 කින් ආපසු ගෙවා නිම කළ යුතුවේ. මෙම ණයවලින්, අවුරුද්දකට අඩු කාලයක් තුල නොගෙවා ඉතිරිව ඇති ණය සඳහා වර්ෂයකට සියයට 4·375 ක ගාස්තුවක් අය කරන අතර ඉන්පසු සෑම වර්ෂයක් සඳහාම එම අනුපාතිකය සියයට 0·5 බැගින් සියයට 6 875 දක්වා වැඩිවේ. ආපසු නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය ප්‍රමාණය 1977 දී රුපියල් දශලක්ෂ 13,221 සිට (වි.හැ.අ. දශලක්ෂ 705) 1978 දී රුපියල් දශලක්ෂ 16,446 (වි හැ.අ. දශලක්ෂ 813) දක්වා වැඩි විය. මෙම වැඩිවීමට හේතු වූයේ යෝජනා ක්‍රම හා භාණ්ඩ ආධාරවලින් ප්‍රධාන වශයෙන් සමන්විත දිගුකාලීන ණය වැඩිවීමය. ආපසු නොගෙවා ඉතිරිව ඇති දිගු කාලීන ණය මට්ටම 1977 දී රුපියල් දශලක්ෂ 10,594 (වි.හැ.අ. දශලක්ෂ 561) සිට 1978 දී රුපියල් දශලක්ෂ 13,803 (වි හැ.අ. දශලක්ෂ 682) දක්වා වැඩි විය. කෙටිකාලීන ණය මත ඇති රැඳියාව අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය ණය ව්‍යුහයෙහි විදේශීය ණයවල වැදගත්කම 1978 දී තවදුරටත් වැඩි විය.

එක්සත් ජනපද ඩොලරය හැර අනෙක් ප්‍රධාන මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය 1978 දී පහත වැටුනි. 1977 නොවැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා රුපියලේ අගය රන් පවුම, ජපන් යෙන්, ජර්මන් මාර්ක් සහ වි.හැ.අ. වලට ප්‍රතිමුඛව පිළිවෙලින් සියයට 8·3, සියයට 18·8, සියයට 16·9 සහ සියයට 6·3 වශයෙන් විය. එසේ වුවද, එක්සත් ජනපද ඩොලරය සමඟ සසඳන විට ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 3·2 කින් වැඩි විය.

## රජයේ මුදල් පරිහරණය

1977 නොවැම්බර් මස හඳුන්වා දුන් ආර්ථික සංශෝධන 1978 රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියේ මට්ටම සහ නැඹුරුවූ දිශාව හැඩ ගැස්වීමෙහි ලා තියුණු බලපෑමක් ඇති කළ බැව් පැහැදිලිව දක්විය හැකිය. මිළෙහි වෙනස්කම්, බදු පදනම පුළුල් කිරීම, බදු අනුපාතිකයන්හි ගැළපීම් සහ වියදම් ඉහළ යෑම අයවැය ලේඛණයේ ප්‍රමාණය දෙගුණ කිරීමට හේතු විය. දිශාව ගැන සඳහන් කරන විට, රජයේ වියදම පාරිභෝජනයේ සිට ආයෝජනය කෙරේ යොමු කිරීම සඳහා ව්‍යුහාත්මක වශයෙන් ගත් පැහැදිලි පරිශ්‍රමයක් දක් වේ. 1977 සංශෝධන කටයුතුවල විශාලත්වය හේතු කොට ගෙන ඇතිවූ වෙනස්කම් නිසා, 1978 අයවැය ලේඛණයේ අවසාන ප්‍රතිඵලය දැන ගැනීම අපහසු කාර්යයක් විය. අවසානයේදී ජංගම ගිණුමේ රුපියල් දශ ලක්ෂ 701 ක හිඟයක් පෙන්විය.

1978 දී රුපියල් දශ ලක්ෂ 173 ක නාමික ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළ බව රජයේ ගිණුම් පිළිබඳ දත්තයන් පෙන්වයි. එහෙත් වර්ෂය අවසානයේ කළ සමහර මූල්‍ය සංක්‍රාමයන් හිලව් කිරීම උදෙසා ගැළපුම් කළ විට සහ නිෂ්කාශණය නොවී තිබූ අධික චෙක්පත් සංඛ්‍යාව සැලකිල්ලට ගත් විට රුපියල් දශ ලක්ෂ 893 ක පමණ සංකෝචනාත්මක බලපෑමක් අය වැය කටයුතු මඟින් ඇතිවුණු බව පෙනේ.[1]

1977 වසරේ රුපියල් දශ ලක්ෂ 9,760 ක් ව පැවැති රජයේ මුළු වියදම 1978 රුපියල් දශ ලක්ෂ 18 939 දක්වා හෙවත් සියයට 94 කින් ඉහළ ගියේය. පුනරාවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 10,408 ක් විය. එය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් විට 1977 දී සියයට 23 සිට 1978 දී සියයට 34 දක්වා ඉහළ යෑමක් පෙන්නුම්

1. ජාතික සංවර්ධන බැංකුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කළ රුපියල් දශ ලක්ෂ 390 ක නාමික සංක්‍රාමිය වෙනුවෙන් සහ වසර අවසානයේ නිශ්කාෂණය නොවූ රුපියල් දශ ලක්ෂ 666 ක චෙක්පත් වෙනුවෙන් දත්ත ගලපා ඇත.